# තනතුරු ඇබෑර්තු

## විශ්‍රාම වැටුප්, සේවක අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හිමිවන වයඹ සමුපකාර දැවැන්තයා සමග එක් වන්නට ඔබට ඇරයුම්

**වයඹ පළාත තුළ මූල්‍ය ක්ෂේත්‍රයේ කටයුතුවල නියැලී සිටින, ද්විතීය මට්ටමේ සමුපකාර සංවිධානයක් වන, සීමාසහිත වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ, පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා මතු දැක්වෙන සුදුසුකම් සපුරා ඇති, වයඹ පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### මුද්‍රණාල කළමනාකරු

**වැටුප් පරිමාණ අංකය** : TSL - III

**වැටුප් පරිමාණය** : රු. 42,900 - 525 X 10 - 650 X 11 - 750 X 10 - 62,800

**වයස** : අවුරුදු 18 - 45

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

(අ) අ.පො.ස. (උ/පෙ.) විද්‍යා අංශයෙන් සමත්ව තිබීම සමග ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ ඉන්ග්‍රීන් මුද්‍රණ හා ග්‍රැෆික්ස් ආයතනයේ නිෂ්පාදන සුපරීක්ෂණය හා පිරිවැය පිළිබඳ පාඨමාලාවක් සාර්ථක ලෙස නිම කිරීම හා පිළිගත් මුද්‍රණ ආයතනයක මුද්‍රණාල කළමනාකරු හෝ (මධ්‍යම ප්‍රමාණය) ජ්‍යෙෂ්ඨ නිෂ්පාදන විධායක තත්ත්වයේ තනතුරක අවම වශයෙන් වසර 05 කට නොඅඩු සේවා පළපුරුද්දක් හෝ

(ආ) අ.පො.ස. (උ.පෙ) විද්‍යා අංශයෙන් සමත්ව තිබීම සමග පිළිගත් මුද්‍රණ ආයතනයක මුද්‍රණාල කළමනාකරු හෝ (මධ්‍යම ප්‍රමාණය) ජ්‍යෙෂ්ඨ නිෂ්පාදන විධායක තත්ත්වයේ තනතුරක අවම වශයෙන් වසර 10 කට නොඅඩු සේවා පළපුරුද්ද හෝ

(ඇ) අ.පො.ස. (සා.පෙ.) ගණිතය, සිංහල, ඉංග්‍රීසි භාෂාව ඇතුළු විෂයයන් 04 කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම හා පිළිගත් මුද්‍රණ ආයතනයක මුද්‍රණාල කළමනාකරු හෝ ජ්‍යෙෂ්ඨ නිෂ්පාදන විධායක තත්ත්වයේ තනතුරක අවම වශයෙන් අවු. 12 ක පළපුරුද්ද.

### ලැබෙන වෙනත් නිත්‍ය හා අමතර ප්‍රතිලාභ

1. විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබීම, උපරිම විශ්‍රාම හිමිකම වැටුප මත 80%.
2. සේවක අර්ථසාධක අරමුදල් සඳහා දළ වැටුප මත ආයතනයෙන් 15% ක දායකත්වය.
3. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා දළ වැටුප මත ආයතනයෙන් 3% ක දායකත්වය.
4. වාර්ෂික නිල ඇඳුම් ලබාදීම.
5. අඩු පොලී මත දෙනු ලබන සේවක ණය පහසුකම්.
6. වාර්ෂික ලාභය මත පදනම් වූ ප්‍රසාද දීමනා. (එක් මාසික වැටුපක්).

### පොදු කොන්දේසි

අ. අයදුම්කරුවන් මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

ආ. අදාළ තනතුර වසර 2 ක පරිවාස කාලයකට යටත්ය.

ඇ. දැනට සමුපකාර සේවයේ නියුක්ත වූවන්ට වයස් සීමාව බලනොපාන අතර, තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ඈ. සියලුම අයදුම්පත් ඇගයීම් මණ්ඩලයක් මගින් නිරීක්ෂණය කරනු ලැබේ. අපේක්ෂිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් හා / හෝ සම්මුඛ පරීක්ෂණයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන පරිදි ඉදිරිපත් විය යුතුවේ.

ඉ. තනතුර සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය තුළ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

(සම්පූර්ණ නම, මුලකුරු සමග නම, ස්ථිර ලිපිනය, ජා.හැ. අංකය, පදිංචි දිස්ත්‍රික්කය, ග්‍රාම නිලධාරී කොට්ඨාසය, උපන් දිනය, වයස, ස්ත්‍රී / පුරුෂ භාවය, විවාහක / අවිවාහක බව, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද හා දුරකථන අංකය ඇතුළුව අදාළ වෙනත් විස්තර)

වැදගත් : අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් ද අනිවාර්යෙන්ම අමුණා එවිය යුතුය.

**1. උප්පැන්න සහතිකය. 2. ලබා ඇති අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික. 3. සේවා සහතික.**

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තමා විසින්ම පිළියෙල කරගත් අයදුම්පත් තම ලිපිනයැති 9X4 ප්‍රමාණයේ මුද්දර ඇලවූ ලියුම් කවරයක් ද සමග 2024-08-07 දින ප.ව. 12.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුරු නාමය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය. අවසන් දිනෙන් පසුව ලැබෙන හා ඉල්ලුම් කර ඇති තොරතුරු රහිත ඉල්ලුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2024-07-17

WCRB

**ගරු සභාපති.**

**සීමාසහිත වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය**

**ග්‍රාමීය බැංකු මන්දිරය, 107, දඹුල්ල පාර, කුරුණෑගල.**

**දුරකථන : 037-2226191/2 ෆැක්ස් 037-2234153**